වැඩි විස්තර සඳහා
www.ibsl.gov.lk
වෙබ් අඩවියට පිවිසෙන්න

මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අනුග්‍රහයෙනි.

# රක්ෂණය ගැන වැඩියමක් දැන ගනිමු




IBSL

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

# රක්ෂණය ගැන වැඩි යමක් දැන ගනිමු

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය

## මෙම කුඩා පොත ගැන

මෙය, රක්ෂණය යනු කුමක්දැයි වටහා ගැනීමට ඔබට උපකාරී වන හඳුන්වා දීමේ අත්වැලකි. රක්ෂණ ව්‍යාපාර වර්ග පිළිබඳවත්, රක්ෂණයේ මූලික සිද්ධාන්ත පිළිබඳවත්, පාඩු අත්විඳීමකදී කළ යුත්තේ කුමක් ද යන්න පිළිබඳවත් මෙමගින් ඔබට තොරතුරු සැපයේ. අදාළ වැඩිමනත් තොරතුරු www.ibsl.gov.lk යන අපගේ වෙබ් අඩවිය ඔස්සේ ඔබට ලබා ගැනීමට පිළිවන.

## රක්ෂණය යනු කුමක්ද?

රක්ෂණය යනු අවදානමක් පවරාදීමේ යාන්ත්‍රනයකි. එමගින් කිසියම් මුදල් ගෙවීමකට එනම්, වාරිකයක් අනුව වෙනත් පාර්ශව කරුවකු වෙත ස්වකීය ජීවිත අවිනිශ්චිතතාවලින් සමහරක් පවරා දිම සඳහා පුද්ගලයන් සහ ව්‍යාපාර ප්‍රයත්න දරයි.

## අවදානම යනු කුමක්ද?

අවදානම යනු "අලාභය ආශ්‍රිත අවිනිශ්චිතතාවයි". රක්ෂණයෙහිලා අවදානම මැනෙනුයේ මූල්‍යමය කොන්දේසි අනුවය.

## රක්ෂණ වර්ග

රක්ෂණය ප්‍රධාන වර්ග දෙකකින් සමන්විතය. ඒ ජීවිත රක්ෂණය හා සාමාන්‍ය රක්ෂණය යනුවෙනි.

| ජීවිත රක්ෂණය | සාමාන්‍ය රක්ෂණය |
|---|---|
| ජීවිත රක්ෂණය ඔබගේ ජීවිතය කිසියම් ආපදා අවස්ථාවකදී යම් මුදල් ප්‍රමාණයක් සඳහා රක්ෂණය කරයි. (රක්ෂිත මුදල) | ජීවිත රක්ෂණය මගින් පිරිනමනු ලබන අලාභ හා හානි නොවන වෙනත් අලාභ හා හානි සඳහා ඔබට රක්ෂණාවරණය සළසා දෙයි. |
| රක්ෂණාවරණ කාල සීමාව සාමාන්‍යයෙන් වසරක කාලයක් ඉක්මවන අතර කලින් නියම කරගත් වාරික ප්‍රමාණයක් මාසික, කාර්තුමය හෝ වාර්ෂික පදනමක් මත ගෙවීම එමගින් අපේක්ෂිතය. | රක්ෂණාවරණ කාල සීමාව සාමාන්‍යයෙන් වසරක කාලයක් වන අතර රක්ෂණ ඔප්පුව නිකුත් කිරීමට පෙර නියමිත වාරිකය ගෙවීම එමගින් බොහෝදුරට අපේක්ෂිතය. |
| ආවරණය කරනු ලබන අවදානම් :<br>අකල් මරණය<br>විශ්‍රාම කාලය තුළ ආදායම | ආවරණය කරනු ලබන අවදානම් :<br>දේපළ අලාභ, උදා: මෝටර් රථය සොරා ගැනීම හෝ නිවස ගිනි ගැනීම.<br>තුන්වන පාර්ශවයකට ඔබ නිසා සිදුවන හානි මගින් උද්ගත වන බැරකම්.<br>තුවාල සිදුවීමෙන් හෝ රෝගයක් හේතු වෙන් වන අහඹු මරණ හෝ ආබාධ. |

| | |
|---|---|
| ප්‍රධාන රක්ෂණ නිමැවුම් :<br>(අ) යාවජීව<br>(ආ) උපපාදන<br>(ඇ) කාලික<br>(ඈ) ආයෝජන හා සම්බන්ධ<br>(ඉ) වාර්ෂික මුදල් / විශ්‍රාම වැටුප් | ප්‍රධාන රක්ෂණ නිමැවුම් :<br>(අ) වාහන<br>(ආ) ගිනි<br>(ඇ) පුද්ගල හදිසි අනතුරු<br>(ඈ) වෛද්‍ය හා සෞඛ්‍ය<br>(ඉ) මුහුදු, ගුවන් තරණ, මාර්ගස්ථ |

## රක්ෂණය සහ සමාජය

1. රක්ෂණ අවදානම්වලට අදාලව අලාභ වෙනුවෙන් පුද්ගලයන්ට, ව්‍යාපාරවලට, ව්‍යවසායකයන්ට සහ සංවිධානවලට වන්දි ලබා දීම මගින් රක්ෂණය මහජනතාවට උපකාරී වේ.
2. රක්ෂණ සමාගම්, අවදානම් වැළැක්වීමේ විවිධ උපායමාර්ගවලට අවතීර්ණව එම ක්‍රියාමාර්ග ප්‍රවර්ධනයෙහි නියැලෙන අතර හදිසි අනතුරු හා අලාභ මගින් උද්ගතවන බලපෑම් සමනය කර ගැනීම සඳහා ද සහය වේ.
3. රක්ෂණය ව්‍යාපාර වර්ධනයටත්, රුකියා උත්පාදනයටත් සහය වනු පිණිස අරමුදල් සපයයි. රජයේ සුරැකුම්පත් හී රක්ෂණ අරමුදල් ආයෝජනය කිරීම රටේ ආර්ථික සංවර්ධනය උදෙසා වූ අරමුදල් මූලාශ්‍රයකි.
4. දේශීය හා විදේශීය වෙළෙඳ කටයුතුවලට මුදල් සපයා ගැනීම සඳහා බැංකුවලට සහ අනෙකුත් මූල්‍ය ආයතනවලට රක්ෂණයේ සුරැකුම අවශ්‍ය වේ.
5. අලාභ උද්ගතවීමකදී ඊට වන්දි ලබා ගනු පිණිස රක්ෂණයේ පිටුවහල පවත්නා බව රක්ෂිතයා දැන සිටින විට ඔහුගේ චිත්ත පීඩාව ඉන් සමනය වේ. එයින් ඔහුගේ සිතේ සාමය ඇතිවේ.
6. සිදුවිය හැකි අලාභ මත වන්දිපූරණය සඳහා අරමුදල් වෙන් කර තැබීමේ අවශ්‍යතාවක් පැන නොනගී.
7. ව්‍යවසායකයන්, රක්ෂණාවරණයක් නොමැතිව තමන් විසින් දරනු ලැබීමට කැමති නොවිය හැකි අවදානම් දරනු ඇත.

## රක්ෂණයේ මූලික සිද්ධාන්ත

<u>රක්ෂණීය අයිතිය:</u>

රක්ෂිත අයිතමය හෝ ජීවිතය සම්බන්ධයෙන් ඔබ සතු අයිතියක් පැවතිය යුතුය. එනම්, රක්ෂිත අයිතමය හෝ ජීවිතය විෂයෙහි සිදුවන යම් අලාභයක් හෝ හානියක් තුළින් ඔබට මූල්‍යමය පාඩුවක් සිදුවනු ඇතැයි යන්නය.

<u>උපරිම සද්භාවය:</u>

රක්ෂණ කොන්ත්‍රාත්තුවක් යනු උපරිම සද්භාවයේ ගිවිස්නාවකි. ඔබ රක්ෂණ ඔප්පුවේ හිමිකරු වශයෙන් කිසියම් රක්ෂණ ඔප්පුවක් මිලදී ගැනීමේදී ඊට අදාළ සියලු වැදගත් කරුණු හෙළිදරව්

කළ යුතුය. එබඳු වැදගත් කරුණු කිසිවක් අනාවරණය කිරීමට ඔබ අසමත් වුවහොත් රක්ෂණ ඔප්පුව නිර්බල වනු ඇත.

ආසන්නතම හේතුව:

අලාභය උද්ගත වනුයේ රක්ෂණය කරන ලද උපද්‍රවයක් සඳහා ද, එසේ නැතහොත් බැහැර කළ ( රක්ෂණය නොකළ ) උපද්‍රවයක් සඳහා ද යනුවෙන් දැන ගැනීමට 'ආසන්නතම හේතුව' පිළිබඳ සිද්ධාන්තය උපකාරී වේ. ඔබ අත්විඳි මූල්‍යමය පාඩුවක් කිසියම් රක්ෂණ සමාගමක් වෙතින් ආපසු අයකර ගැනීමට ඔබට පිළිවන් වීමට පෙර ආසන්නතම හේතුව කවරක්ද යන්න පිළිබඳව නිසැකව දැන ගැනීම අවශ්‍ය වේ.

හානි පූරණය:

අලාභය මූල්‍යමය වශයෙන් ගණනය කළ හැකි දේපළක් කෙරෙහි සිදුවන භෞතික හානිය සම්බන්ධයෙන් පමණක් අදාළ වේ. රක්ෂණ ඔප්පුවක් තුළින් ඔබට 'ලාභ ලැබිය' නොහැක. ඔබ විසින් අලාභයක් අත් විඳිනු ලැබූ අවස්ථාවකදී, එකී අලාභයට පෙර ඔබ සිටි තත්වය කරා ඔබව ගෙනෙනු පිණිස අදාළ රක්ෂණ සමාගම ඔබට මුදල් ගෙවනු ඇත. එසේ නැතහොත්, ඔබ වෙත 'හානි පූරණය' සලසා දෙනු ඇත.

දායකය:

කිසියම් දේපළක් ආරක්ෂා කර ගැනීම සඳහා එක් රක්ෂණ ඔප්පුවකට වඩා මිළට ගැනීම පිළිබඳ තහංචි ඔබ වෙත පනවා නොමැත. ඔබ එක් රක්ෂණ ඔප්පුවකට වඩා මිළදී ගන්නේ නම්, අදාළ රක්ෂණ සමාගම්, කිසියම් හිමිකම් පෑමක් ඉදිරිපත් වීම මත ස්වකීය බැඳීමෙහි ප්‍රමාණයට අනුව දායක වී අදාළ ගෙවිය යුතු මුදල ඔබ වෙත ලබා දෙනු ඇත.

ආදේශනය:

කිසියම් පුද්ගලයෙකු නොසැලකිලිමත් භාවයෙන් යුතුව ඔබගේ දේපළ කෙරෙහි හානි පමුණුවන අවස්ථාවකදී එකී තැනැත්තා එම අලාභය සම්බන්ධයෙන් වගකීම දැරිය යුතුය. රක්ෂණ ඔප්පුවක් යටතේ අදාළ අලාභය ආපසු අයකර ගැනුණ ද, අදාළ අපරීක්ෂාකාරී තැනැත්තා වෙතින් සිදුව ඇති අලාභය අයකර ගැනීමේ අයිතිය ඔබ සතුය. එනෙකුදු වුවත්, ආදේශන සිද්ධාන්තය ඔස්සේ, අදාළ හිමිකම් ඉල්ලා සිටීම රක්ෂණ සමාගම විසින් ගෙවා දැමීමෙන් අනතුරුව අදාළ අපරීක්ෂාකාරී තැනැත්තා වෙතින් වන්දි අයකර ගැනීම පිළිබඳ ඔබ සතු අයිතිය එකී රක්ෂණ සමාගම විසින් පවරා ගනු ලබනවා ඇත.

## මා හට රක්ෂණ නිමැවුමක් අත්කර ගත හැකි ස්ථාන කවරේද?

රක්ෂණ ඔප්පුවක් පහත දැක්වෙන පරිදි ඔබට මිළදී ගත හැකිය.

- රක්ෂණ සමාගම් වෙතින් සෘජුවම.
- ලියාපදිංචි රක්ෂණ නියෝජිතයන් මගින්.
- ලියාපදිංචි රක්ෂණ තැරැව්කරුවන් වෙතින්.
- රක්ෂණ සමාගම් සමග බැංකු සුරැකුම් ක්‍රම ස්ථාපිත කොටගත් බැංකු කටයුතු ආයතන මගින්.

## රක්ෂණ ඔප්පුවක් මිලදී ගැනීමේදී සලකා බැලෙන ප්‍රයෝජනවත් කරුණු

රක්ෂණ තිමැවුමෙහි ලක්ෂණ, කොන්දේසි, ප්‍රතිලාභ, සීමා කිරීම් හා බැහැර කිරීම් ඇතුලුව රක්ෂණ ඔප්පුවෙහි / සැලැස්මෙහි ඇති කරුණු අවබෝධ කර ගැනීම.

ගෙවිය යුතු වාරිකය හෝ දායකය දැරිය හැකි එකක් බවට වගබලා ගැනීම.

ඔබ ලබා ගන්නා රක්ෂණාවරණයේ මුදල ප්‍රමාණවත් හා ඔබේ අවශ්‍යතාවන්ට ගැලපේ ද යනුවෙන් වගබලා ගැනීම.

වැදගත් කරුණු සියල්ලක්ම හෙළිදරව් කර ඇති බවට වගබලා ගැනීම.

ලියාපදිංචි රක්ෂණ නියෝජිතවරුන් හෝ ලියාපදිංචි රක්ෂණ තැරැව්කරුවන් සමග හෝ සෘජුවම රක්ෂණ සමාගම් සමග පමණක් ගනුදෙනු කිරීම.

රක්ෂණාවරණයේ කාලපරිච්ඡේදය සහ අදාළ වාරිකය ගෙවීමේ කාල වකවානුව පිළිබඳව සුපරීක්ෂාවෙන් පසුවීම.

## රක්ෂණ හිමිකම් පෑමක් කළ යුතු ආකරය

අදාළ අලාභය හෝ හානිය ඔබගේ රක්ෂණ ඔප්පුවෙන් හෝ සහතිකයෙන් ආවරණය කර ඇත්දැයි පිරික්සා බලන්න.

අදාළ සිදුවීම ගැන ඉක්මණින් ඔබේ රක්ෂණ සමාගම වෙත දැනුම් දී ඔබේ හිමිකම් පෑම සනාථ කිරීම සඳහා අවශ්‍ය ලිපිලේඛන පිළිබඳව උපදෙස් පතන්න.

සහයෝගීව කටයුතු කර ඔබගේ රක්ෂණ සමාගම විසින් ඉල්ලා සිටිනු ලබන සියලු තොරතුරු සම්පූර්ණයෙන් හා නිවැරදිව සපයන්න.

සාවද්‍ය හා අසම්පූර්ණ තොරතුරු ඔබේ හිමිකම් පෑම සකස් කිරීමේ ප්‍රමාද ඇතිකරවිය හැකිය.

සියලුම ලිපිලේඛනවල පිටපත් හා වාර්තා සුරක්ෂිතව තබා ගන්න. උදා: බිල්පත්, වාර්තා හා ලිපි හුවමාරු.

අදාළ හිමිකම් පෑම නිරාකරණය කෙරෙන තෙක් නිරතුරුවම ඔබේ රක්ෂණ සමාගම අමතන්න. අදාළ මුදල් පිරිනැමුම ඔබ අපේක්ෂා කළ පරිදි නොවේ නම්, ඒ පිළිබඳව ඔබේ රක්ෂණ සමාගම සමග සාකච්ඡා කරන්න. දෙපාර්ශවයම සද්භාවයෙන් යුතුව මෙම සාකච්ඡා සම්මුතීන්ට එළඹිය යුතුය.

## පැමිණිලි නිරාකරණය කර ගැනීමේ මාර්ග

ඔබ ඔබේ රක්ෂණ සමාගම සම්බන්ධයෙන් අප්‍රසාදයට පත්ව සිටින්නේ නම් හෝ ඔවුන් ඔබ කෙරෙහි අසාධාරණ අයුරින් කටයුතු කර ඇතැයි ඔබට හැඟෙන්නේ නම් ඒ සඳහා අධිකරණය ඉදිරියට යාමට පෙර අදාළ සහන සලසා ගැනීමේ මාර්ග කීපයක් ඇත.

ඔබ ඔබේ පැමිණිල්ල පළමුව අදාල රක්ෂණ සමාගමේ පැමිණිලි ඒකකය වෙත හෝ එහි වගකිව යුතු නිලධාරියකු වෙත ඉදිරිපත් කළ යුතුය.

අදාල පැමිණිල්ල නිරාකරණය සම්බන්ධයෙන් ඔබ සෑහීමට පත් නොවන්නේ නම්, එය රක්ෂණ ඔම්බුඩ්ස්මන් (තීරක) වරයා වෙත ඉදිරිපත් කිරීමට ඔබට පිළිවන.

රක්ෂණ ඔම්බුඩ්ස්මන්
143A, වජිර පාර
කොළඹ 5.
දුරකථනය: 011- 4528671/2 ෆැක්ස්: 011- 4528670
විද්‍යුත් තැපැල: info@insuranceombudsman.lk
වෙබ් අඩවිය : www.insuranceombudsman.lk

රක්ෂණ ඔම්බුඩ්ස්මන් (තීරක) වරයා විමසීමෙන් පසුව ද තවදුරටත් පවත්නා කිසියම් ගැටළු තිබේ නම්, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ඇමතීමට නිරතුරුවම ඔබට පිළිවන.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය
11 වන මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය,
එචලන් චතුරශ්‍රය, කොළඹ 1.
දුරකථනය : 011- 2396184 සිට 89 දක්වා ෆැක්ස් : 011- 2396190
විද්‍යුත් තැපැල: ibsl@eureka.lk
වෙබ් අඩවිය : www.ibsl.gov.lk

## 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරන ලද රක්ෂණ සමාගම්

| රක්ෂකයාගේ නම | රක්ෂණ පංතිය | ලියාපදිංචි දිනය |
|---|---|---|
| 1. ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කොපරේෂන් ලිමිටඩ් | දීර්ඝ කාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය | 1993.02.03 |
| 2. යුනියන් ඇෂුවරන්ස් පී.එල්.සී. | දීර්ඝ කාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය | 1987.01.08 |
| 3. සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පී.එල්.සී. | දීර්ඝ කාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය | 1987.02.11 |
| 4. ඊගල් ඉන්ෂුවරන්ස් පී.එල්.සී. | දීර්ඝ කාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය | 1987.12.16<br>1987.12.29 |
| 5. ජනශක්ති ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | දීර්ඝ කාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය | 1994.08.12<br>1995.09.11 |
| 6. කෝපරේටිව් ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | දීර්ඝ කාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය | 1998.09.18 |
| 7. ඒෂියන් ඒලායන්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී. | දීර්ඝ කාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය | 2000.03.08<br>1999.09.17 |
| 8. හේලිස් ඒ.අයි.ජී. ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය | 1999.12.13 |
| 9. එච්.එන්.බී.ඇෂුවරන්ස් පී.එල්.සී. | දීර්ඝ කාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය | 2001.08.30 |
| 10. අමානා ටකපුල් පී.එල්.සී. | දීර්ඝ කාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය | 2002.02.01 |
| 11. ලයිෆ් ඉන්ෂුවරන්ස් කෝපරේෂන් (ලංකා) ලිමිටඩ් | දීර්ඝ කාලීන රක්ෂණය | 2002.12.18 |
| 12. සීමාසහිත සණස රක්ෂණ සමාගම | දීර්ඝ කාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය | 2003.07.08<br>2005.01.06 |
| 13. ඇලියොන්ස් ඉන්ෂුවරන්ස් කම්පනි ලංකා ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය | 2004.09.24 |
| 14. ඒ.බී.සී.ඉන්ෂුවරන්ස් කම්පනි ලිමිටඩ් | දීර්ඝ කාලීන රක්ෂණය<br>සාමාන්‍ය රක්ෂණය | 2005.04.01<br>2005.08.02 |
| 15. සෙලින්කෝ ටකපුල් ලිමිටඩ් | සාමාන්‍ය රක්ෂණය | 2006.05.16 |

## 2003 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරන ලද රක්ෂණ තැරැව්කරුවන් - 17 / 04 / 2008 දිනට

| රක්ෂණ තැරැව්කරු | ලියාපදිංචි කාල සීමාව | ව්‍යාපාර පංතිය |
|---|---|---|
| 1. ඒ එම් ඩබ්ලිව් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 2. ඒ ඩී ඉසෙඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 3. එයිට්කන් ස්පෙන්ස් ඉන්ෂුවරන්ස් බෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.03.28 - 2009.03.27 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 4. ඇල්ෆින්කෝ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.18 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 5. ඇල්ලියන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2007.11.15 - 2008.11.14 | සාමාන්‍ය |
| 6. ඇම්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 7. ආකේඩියා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.02.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 8. බ්‍රිලියන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 9. සී ඒ එල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2007.12.31 - 2008.12.30 | සාමාන්‍ය |
| 10. සී ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 11. සීඑක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 12. සෙලාන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 13. සී එෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 14. කළම්බු ඉන්ෂුවරන්ස් බෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.02.12 - 2009.02.11 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 15. කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 16. ඩෙල්මේජ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 17. ඩී පී ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | සාමාන්‍ය |
| 18. ඊක්විටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |

| | | |
|---|---|---|
| 19. එස්සාජ් කරිම්ජ් ඇන්ඩ් කම්පනි (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 20. ෆින්ලේ ඉන්ෂුවරන්ස් (බ්‍රෝකර්ස් ) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 21. ඉන්ඩ්කොම් ඉන්ඩස්ට්‍රියල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | සාමාන්‍ය |
| 22. ඉන්ඩස්ට්‍රියල් ඇන්ඩ් කොමර්ෂල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.07 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 23. ඉන්සුරෙක්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් කම්පනි (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 24. ඉන්ටර්බ්‍රෝකර් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.08 - 2008.12.31 | සාමාන්‍ය |
| 25. ජේ ඉන්ෂුවරන්ස් කන්සල්ටන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 26. කොෂිබා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | සාමාන්‍ය |
| 27. එල් එම් ඇන්ඩ් ඒ ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ඇන්ඩ් කන්සල්ටන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 28. ලක් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 29. ලංකා ඔරික්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 30. මැක්වුඩ්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 31. මැක්ස්වෙල් එන්ටප්‍රයිසස් ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 32. නේෂන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලිමිටඩ් | 2008.01.10 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 33. ප්ලැසිඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2007.07.09 - 2008.07.08 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 34. ප්‍රෝකෙයා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 35. ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් ඇෂුවරන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 36. ප්‍රොටෙක්ෂන් ඇන්ඩ් අට්මෝස්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.16 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 37. රිලයන්ස් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2007.03.21 - 2008.03.20 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 38. රෝ-පා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 39. සේනාරත්න ඇසෝසියේට්ස් ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |

| | | |
|---|---|---|
| 40. ස්ටුවර්ට් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2007.09.14 - 2008.09.13 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 41. ස්ට්‍රැටජික් ඉන්ෂුවරන්ස් බෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.03.24 - 2009.03.23 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 42. ස්ට්‍රැටජික් සොලූෂන්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | සාමාන්‍ය |
| 43. සන් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2007.11.13 - 2008.11.12 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 44. යුනයිටඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | සාමාන්‍ය |
| 45. යුනයිටඩ් ලයිෆ් ඇන්ඩ් ජෙනරල් ඇෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 46. වනික් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.04.01 - 2008.04.30 | සාමාන්‍ය |
| 47. වෙරසිටි ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 48. වර්ටෙක් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.02.14 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 49. වික්ටර් එම්මැනුවල් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 50. විපන්වයිඩ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකරින් ඇන්ඩ් ෆිනැන්ෂියල් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 51. වොලන්කා ඉන්ෂුවරන්ස් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |
| 52. සෙනිත් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් | 2008.01.01 - 2008.12.31 | දීර්ඝ කාලීන හා සාමාන්‍ය |

## 2008 වර්ෂය සඳහා ලියාපදිංචිය අලුත් කර ගැනීමට අපේක්ෂිත රක්ෂණ තැරැව්කාර සමාගම් - 2008. 04. 17 දිනට

| රක්ෂණ තැරැව්කරුගේ නම |
|---|
| ජේ එෆ් ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් |

## බැඳියාව නොපිළිගැනීම

මෙම ලියවිල්ල මගින් අපේක්ෂා කරනුයේ ඔබ වෙත සාමාන්‍ය තොරතුරු සපයා දීම පමණි. විෂයානුබද්ධ කරුණුවලට අදාළ පරිපූර්ණ උපදෙස් හෝ තොරතුරු මෙහි අඩංගු නොවේ. එමෙන්ම, නීති උපදෙස් සැපයීමේ ආදේශකයක් වශයෙන් ද මෙය උපයෝගී කර ගත නොහේ.